# ලංකා විදුලිබල මණ්ඩලය

## ව්‍යාපෘති අංශය

# ඇබෑර්තු - කොන්ත්‍රාත් පදනම

ලංකා විදුලිබල මණ්ඩලයේ තාප විදුලිබල ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා කොන්ත්‍රාත් පදනම මත පාරිසරික හා සමාජ ආරක්ෂණ විශේෂඥවරයෙකු බඳවා ගැනීම සඳහා පහත සඳහන් සුදුසුකම්, පළපුරුද්ද සහ වෘත්තීය නිපුණතා ඇති ශ්‍රී ලංකාවේ පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## පාරිසරික හා සමාජ ආරක්ෂණ විශේෂඥ - ඇබෑර්තු 01 කි

**සුදුසුකම් හා අත්දැකීම් :**

- පිළිගත් කරන ලද විශ්වවිද්‍යාලයකින් ලබාගත් ජීව විද්‍යාව, පාරිසරික විද්‍යාව / කළමනාකරණය, සමාජ විද්‍යාව, ස්වාභාවික සම්පත් කළමනාකරණය, වන විද්‍යාව, කෘෂිකර්මාන්තය, ව්‍යවහාරික විද්‍යාව හෝ වෙනත් ආශ්‍රිත විද්‍යා ක්ෂේත්‍රයන්හි පළමු උපාධිය.

**සහ**

- පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් පාරිසරික විද්‍යාව හෝ පරිසර කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි සුදුසුකම්.

**සහ**

- පාරිසරික අධීක්ෂණ හා සමාජ ආරක්ෂණ ආශ්‍රිත ක්‍රියාකාරකම් පිළිබඳ අවුරුදු 15 කට වැඩි පළපුරුද්ද (මහා පරිමාණ යටිතල පහසුකම් ව්‍යාපෘති / බලාගාර ආදිය සම්බන්ධ ක්‍රියාකාරකම්වල වසර 10 කට වැඩි පළපුරුද්දක් තිබිය යුතුය)
- විදේශීය අරමුදල් සපයන ව්‍යාපෘති පිළිබඳ අත්දැකීම් අමතර සුදුසුකමක් වනු ඇත.

| | | |
|---|---|---|
| **වයස් සීමාව** | : | අවුරුදු 45 ට වැඩි පුද්ගලයින් සලකා බලනු ලබන්නේ සුවිශේෂී හේතු මත පමණි. |
| **වේතනය** | : | අයදුම්කරුගේ සුදුසුකම් හා පළපුරුද්ද මත වැටුප් සාකච්ඡා කරගත හැකි අතර, එය 2019 මාර්තු 15 දිනැති මුදල් අමාත්‍යංශය විසින් නිකුත් කරන ලද කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2019 ට යටත් වේ. |
| **තෝරා ගැනීම** | : | තෝරා ගත් අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයක් මගින් |
| **කාර්යය ස්ථානය** | : | ව්‍යාපෘති කාර්යාලය කොළඹ, පුත්තලම හෝ ත්‍රිකුණාමලය<br>(තෝරා ගත් අයදුම්කරුවන් ව්‍යාපෘතියේ අවශ්‍යතාවයන් අනුව වැඩබිම් තුළ සේවය කළ යුතුය.) |
| **අයදුම්පත් භාරගන්නා අවසන් දිනය** | : | 2020 ඔක්තෝබර් මස 08 වැනිදා පෙරවරු 10.00 |

**වෘත්තීය සහ වෙනත් නිපුණතා:**

- ව්‍යාපෘතියේ පාරිසරික බලපෑම් තක්සේරු කිරීම සහ අධීක්ෂණය, විමෝචන කළමනාකරණය සහ ජෛව විවිධත්ව කළමනාකරණයට අදාළ තාක්ෂණික සේවාවන් සැපයීමේ හැකියාව, ජාතික හා ජාත්‍යන්තර මාර්ගෝපදේශයන්ට අනුව අවම කිරීමේ පියවර යෝජනා කිරීම සහ ක්‍රියාත්මක කිරීම.
- විශේෂඥතාවය මත නිශ්චිත ක්ෂේත්‍රයන්හි ව්‍යාපෘති පාරිසරික හා සමාජ ආරක්ෂණ ආශ්‍රිත ක්‍රියාකාරකම් ස්වාධීනව හැසිරවීමේ හැකියාව.
- ව්‍යාපෘතියේ අනෙකුත් කණ්ඩායම් සාමාජිකයින්ගේ විශ්වාසය හා සහයෝගීතාවයට අනුබල දෙන කණ්ඩායම් පරිසරයක් තුළ ඵලදායී ලෙස ක්‍රියා කිරීමේ හැකියාව.
- පාරිසරික හා සමාජ ආරක්ෂණ සම්බන්ධ ක්‍රියාත්මක කිරීමේ ගැටළු ඵලදායී ලෙස විශ්ලේෂණය කර විසඳීමේ හැකියාව.
- මහජන සම්බන්ධතා කුසලතා.
- පරිගණක භාවිතය පිළිබඳ කුසලතාවය.
- ඵලදායී ලෙස සන්නිවේදනය කිරීමේ හැකියාව.
- ඉහළ ලිඛිත හා කථිත ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාව.
- ලිඛිත හා කථිත දෙමළ භාෂා පිළිබඳ ප්‍රවීණතාවය අතිරේක සුදුසුකමක් වනු ඇත.

**නියම හා කොන්දේසි:**

- මෙම පත්වීම කොන්ත්‍රාත් පදනම මත වසර දෙකක් සඳහා වේ.
- ව්‍යාපෘතියේ ඉදිරි අවශ්‍යතාවය මත පමණක් කොන්ත්‍රාත් කාලය දීර්ඝ කරනු ලැබිය හැකිය. පත්වීම් ලිපියේ සඳහන් පරිදි සේවය දීර්ඝ කිරීමේ හෝ අවසන් කිරීමේ පූර්ණ අයිතිය ලංකා විදුලිබල මණ්ඩලය සතුවේ.
- ලංකා විදුලිබල මණ්ඩලයේ ස්ථිර සේවකයන් බඳවා ගැනීමකදී සුදුසුකමක් ලෙස මෙම පත්වීම සලකනු නොලැබේ.
- මූලික ස්ථානය කොළඹ ව්‍යාපෘති කාර්යාලය වන අතර, ව්‍යාපෘතියේ අවශ්‍යතා අනුව වැඩ බිම් වෙත පිවිසිය යුතුය.

**වෙනත් ප්‍රතිලාභ:**

- තෝරාගනු ලබන අයදුම්කරුවන් සේවක අර්ථසාධක අරමුදල (EPF) සඳහා දායකත්වය ලබන අතර, සේවකයාගේ මාසික වැටුපෙන් 10%ක ප්‍රතිශතයක් හා ලං.වි.ම මගින් 15% ක ප්‍රතිශතයක් ඒ සඳහා බැර කෙරේ.
- සේවක භාර අරමුදල (ETF) සඳහා ලං.වි.ම මගින් 3%ක ප්‍රතිශතයක් බැර කෙරේ.

ලං.වි.ම වෙබ් අඩවියේ (**https://www.ceb.lk/careers/en**) ඇති අයදුම්පත පුරවා අන්තර්ජාලය මගින් ඉදිරිපත් කරන ලෙස අයදුම්කරුවන්ගෙන් ඉල්ලා සිටී. මීට අමතරව, සියලු අයදුම්කරුවන් විසින් තම ජීව දත්ත තොරතුරු ද ඇතුළත් කරමින් අත්සන් කරන ලද මුද්‍රිත අයදුම්පත (සුදුසුකම් වලට අදාළ ලියකියවිලි හා සහතික පත්‍ර වල පිටපත් සහිතව) යොමු කළ යුතු වේ. එසේම ඥාතීන් නොවන පුද්ගලයන් දෙදෙනෙකුගේ නම, ලිපිනය හා සම්බන්ධ කරගත හැකි තොරතුරු ද සහිතව ඉදිරිපත් කළ යුතුය.

අයදුම්පත් භාරගන්නා අවසන් දිනට හෝ ඊට පෙර ලැබෙන පරිදි පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපැල මගින් යොමු කළ යුතුය. අයදුම් කරනු ලබන තනතුර ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ පැහැදිලිව දැක්විය යුතුය.

ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් පරීක්ෂාවෙන් තෝරා ගනු ලබන අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවනු ලබන අතර කිසිදු ආකාරයකින් හෝ සිදු කරනු ලබන බලපෑමක් නුසුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

දැනටමත් රාජ්‍ය සේවයේ හෝ රාජ්‍ය ආයතනවල සේවය කරන අයවළුන් අයදුම්පත් ඉදිරිපත් කිරීමේ දී තම අංශ ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතු අතර, ඉහත තනතුරු සඳහා තෝරාගනු ලැබීමකදී අයදුම්කරු රැකියා ස්ථානයෙන් නිදහස් කළ හැකිද යන බව පැහැදිලිව දක්වා තිබිය යුතුවේ.

**වැඩි විස්තර:**

**ව්‍යාපෘති අධ්‍යක්ෂ (ග.බ.ව්‍යා.)**
**දුරකථන: 0112 337 635/ 0112 337 636**

**ව්‍යාපෘති අධ්‍යක්ෂ කාර්යාලය (ග.බ.ව්‍යා.),**
**3 වන මහල, 65/1, ර. නි. ය. ස. ගොඩනැගිල්ල,**
**ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත, කොළඹ 02.**

ලංකා විදුලිබල මණ්ඩලය
இலங்கை மின்சார சபை
CEYLON ELECTRICITY BOARD

Source: Dinamina, Daily News (2020.09.24)